## සංක්ෂිප්තය

කළමනාකරණ ක්‍රියාවලියේදී ආයතනයක් සතු සම්පත් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා සම්පතක් වශයෙන් කාලය හැඳින්විය හැකි ය. වර්තමාන කාර්යබහුල වූ සංකීර්ණ සමාජය තුළ "කාලය"ට ඇත්තේ ඉහළ ප්‍රමුඛතාවකි.

අධ්‍යාපන පද්ධතිය ගත්කළ කාලය ඉතා වැදගත් සම්පතකි. නිරන්තරව වැයවන මෙකී සම්පත සැමවිටම වෙනස්වන ප්‍රවණතාවකින් යුක්ත වන හෙයින් පාසලේ දෛනික කටයුතු සංවිධානය කිරීමේ දී මේ ගැන දැඩි අවධානයක් යොමුකළ යුතු ය.

මේ නිසා පාසලේ කාලය කළමනාකරණය සඳහා යොදා ගන්නා උපාය මාර්ග පිළිබඳව ප්‍රධාන අරමුණු හයක් ඔස්සේ පර්යේෂකයා විසින් පර්යේෂණයක් දියත්කරන ලදී. මෙහිදී මතු සඳහන් පර්යේෂණ අරමුණු ඒ සඳහා උපයෝගි කරගන්නා ලදී. එනම්,

කාලය කළමනාකරණය සම්බන්ධයෙන් පාසල් කාර්යමණ්ඩල සාමාජිකයින් ගේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම, පාසලේ කාලය අපතේ යන විවිධ ස්වරූපයන් හඳුනා ගැනීම, කාලය කළමනාකරණය සඳහා පාසල් විසින් ගෙන ඇති විවිධ ප්‍රයත්නයන් හඳුනා ගැනීම, කාලය කළමනාකරණයේ දී පාසල මුහුණදෙන ගැටලු හඳුනා ගැනීම, කාලය කළමනාකරණ ගැටලු අවමකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගවල ගුණදොස් විමසීම සහ සාර්ථක කාලය කළමනාකරණයක් සඳහා ප්‍රතිචාර දෙන්නන්ගේ අදහස් විමසා බැලීම වශයෙනි.

රත්නපුර අධ්‍යාපන කලාපයේ සියලුම අධ්‍යාපන කොට්ඨාශයන් නියෝජනය වන ආකාරයට 1AB වර්ගයෙන් පාසල් එකක් ද, 1C වර්ගයෙන් පාසල් තුනක් ද, 2 වර්ගයේ පාසල් හතක් ද වශයෙන් කලාපයේ පාසල් අතරින් සියයට 10ක නියැදියක් පර්යේෂකයා නියැදිය වශයෙන් තෝරාගෙන ඇත. මෙහිදී විදුහල්පතිවරු එකොළහක් නියැදියට ඇතුළත් වෙති. තවද එම පාසල් එකොළහේ ගුරුවරු 99ක් හා 6-9 ශ්‍රේණිවල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 143ක් නියැදියට ඇතුළත් වෙති. මෙම සමස්ත නියැදිය ස්ථරායන අහඹු නියැදීම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී.

පර්යේෂණය දියත්කිරීමේදී ගුරු සිසු දෙපාර්ශවය වෙත ප්‍රශ්නාවලි දෙකක් ඉදිරිපත් කර තොරතුරු ලබාගත් අතර විදුහල්පතිවරුන් සමග සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කර ගන්නා ලදී. මීට අමතරව පර්යේෂකයා විසින් නිරීක්ෂණය හා ලේඛන සමීක්ෂණය යන ක්‍රමවේදයන් ද භාවිතයට ගනු ලැබිය.

පර්යේෂණය දියත්කිරීමේදී ගුරු සිසු දෙපාර්ශවය වෙත ප්‍රශ්නාවලි දෙකක් ඉදිරිපත් කර තොරතුරු ලබාගත් අතර විදුහල්පතිවරුන් සමග සම්මුඛ සාකච්ජා මගින් දත්ත රැස්කර ගන්නා ලදි. මීට අමතරව පර්යේෂකයා විසින් නිරීක්ෂණය හා ලේඛන සමීක්ෂණය යන ක්‍රමවේදයන් ද භාවිතයට ගනු ලැබීය.

දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම භාවිතයට ගනු ලැබී ය. එහිදී වගු, ප්‍රතිශත හා ප්‍රස්තාර සටහන් උපයෝගිකර ගනිමින් දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදි.

මෙම අධ්‍යයනයේදී පාසලේ කාලය කළමනාකරණයේ දී ගැටලු මතුවීමට ප්‍රධාන හේතුවක් ලෙස කාලය අපතේ යන සහ නාස්ති වන අවස්ථා රැසක් පැවතිම බව අනාවරණය විය. විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පාසලට පැමිණීමේදීත්, පාසලේ උදෑසන රැස්වීම ඇතුළු විවිධ රැස්වීම් හේතුවෙනුත්, ගුරුවරුන් ලබාගන්නා නිවාඩු හේතුවෙනුත් කාලය අපතේ යන අවස්ථා මතු වේ. මීට පිළියමක් ලෙස සහන කාලසටහන ක්‍රියාත්මක වුව ද එය එතරම් සාර්ථකත්වයක් පෙන්නුම් කර නොමැත.

පාසල විසින් කාලය කළමනාකරණයට විවිධ උපාය මාර්ග භාවිතයට ගත්ත ද ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නැගෙන්නේ අල්ප වශයෙනි. විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට කාලය කළමනාකරණය පිළිබඳ යම් මට්ටමක දැනුමක් පැවතිය ද එය භාවිතයට ගැනීමේ දුර්වලතා පවතින බව පෙනේ. මේ නිසා සියලුම විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට කාලය කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම තුළින් ඔවුන් සතු දැනුම ප්‍රවර්ධනයට කටයුතු කිරීම යෝග්‍ය වෙයි. කාලය අස්පෘශ්‍ය හෙවත් භෞතිකමය නොවන සම්පතක් වන නිසාත් එය කළමනාකරණය අපහසුය. මේ නිසා වඩා වැදගත් වන්නේ කාලයට අනුව තම කාර්යයන් කළමනාකරණය කිරීමට යොමු කරවීමයි.

## Abstract

Time is one of the important resourses amoung the resourses in an organization. The time will take an important place in todays challenging and competitive society.

In the educational sector, time is very important resourse. Therefore in organising day to day activities at school more attention should be dewoted to the time management. As such the researcher decided to lounch a research under six objectives how to use time management effectively during the school hours. They are, Investigate reactivity is the staff of the school in time management, Identify the various ways of time wasting in the school, Iidentify various attempts taken by the school in time management, Identify the problems faced by the school in time management, Evaluate the steps taken in order to minimize those problems and Inquire in to the views of the respondents for the effective time management.

The researcher conducted the research by taking a sample eleven schools in the Ratnapura educational zone covering all the educational divisions.

One school in 1AB catagary, three schools in 1C catagary and seven schools in type 2 catagary.

The sample consists to eleven principals of eleven schools, ninety nine teachers of the same schools and 143 students of grade 6 – 9. The method of sample selection was done by evaluating the entire population (data) under structured sampling system.

The researcher conductd the research by issuing questionnaires to the teachers and students in order to collect information. Direct interviews were administerd with the principals. Apart from this the researcher had used methods such as derect evaluations and documentary evidence for this purpose.

It is observed school activities of the principals and teachers, meeting such as morning and leave utilization of teachers have caused wastage in school time. As a remedy fof time although there are consessionary time tables in force, it also not shown any results.

Although the schools introduce various methods to overcome the problems in time management, the result in a few.Even the knowledge which have by the principals and teachers in time management those cannot be used due to weakneses in the system.

Considering the above tools the researchers view in that to provide practical training to the principals and teachers how time can be used effectively and efficiently.More important is that to set –up the purpose according to the time availability.